# වනජීවී අඩවි සහාකාර වෘත්තිකයින්ගේ සංගමය


ඩබ්.එම්.කේ.විජේකෝන්,
සභාපති,
වනසත්ව අඩවි ආරක්ෂක,
සහකාර අධ්‍යක්ෂ කාර්යාලය,
C10 , නව නගරය ,
පොළොන්නරුව.
0714495764
ලි.ප.අං:- 8820

බී.ජී.ධර්මවීරසේන,
ලේකම්,
වනසත්ව අඩවි ආරක්ෂක,
වෙහෙරගල අඩවිය,
වෙහෙරගල.

0701407074

ඩබ්.එම්.එල්.කේ.වාසල,
භාණ්ඩාගාරික,
වනසත්ව අඩවි ආරක්ෂක,
මින්නේරිය ජාතික උද්‍යානය,
අඹගස්වැව, හබරණ

0719437515


2022. 09. 24

අධ්‍යක්ෂ ජනරාල් (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව) මගින්,

අමාත්‍යාංශ ලේකම් (වනජීවී හා කෘෂිකර්ම අමාත්‍යාංශය) මගින්,

සභාපති (රාජ්‍ය සේවා කොමිසන් සභාව).

**<u>වනජීවී නිලධාරීන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරමින් විදේශියව පැවැත්වීමට යන වනජීවී නීතිය ක්‍රියාත්මක කිරීමේ පාඨමාලාව අවලංගු කර නැවත විධිමත් ආකාරයට පවත්වන ලෙස ඉල්ලා සිටීම.</u>**

වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් අත්සන් තබා අංක:-වජී/5/16/Special Training 01/2021 හා 2021.07.16 දිනැති ලිපිය මගින් වනජීවී කාර්යාල වලට දැනුම් දී තිබුනේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන වනජීවී නීතිය ක්‍රියාත්මක කිරීමේ පාඨමාලාව සඳහා වනසත්ව අඩවි ආරක්ෂක I , II, III , වනසත්ව අඩවි ආරක්ෂක , වනසත්ව නියාමක නිලධාරීන් වෙත අයදුම්පත් ඉදිරිපත් කරන ලෙසය. අදාල අයදුම් පත්‍රය එම ලිපිය සමඟ කාර්යාල වලට එවා තිබුණි. නමුත් මෙම අයදුම්පත්‍රය සමඟ එවා තිබූ ලිපියෙන් මෙම පාඨමාලාව සඳහා නිලධාරීන් තෝරා ගන්නා ක්‍රමවේදය, තරඟ විභාගය පවත්වන මාධ්‍ය, පාඨමාලාව දේශියවද විදේශියවද පැවැත්වෙන්නේද යනවග සහ පාඨමාලාවේ අන්තර්ගතය පිළිබඳව කිසිදු සටහනක් නොතිබිණි. එමෙන්ම සමහර කාර්යාල සහ නිලධාරීන් මෙම පාඨමාලාව පිළිබඳ නිසි පරිදි දැනුවත් කිරීම් කිසිදු අයුරකින් සිදු නොවී ඇති බවද ක්ෂේත්‍රය තුළ අධ්‍යනයේදි අණාවරණය වී ඇත. තවද පාඨමාලාව සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳව කිසිදු සටහනක් නොතිබූ අතර ,වෘත්තිය සුදුසුකම් (පාඨමාලාවට තෝරා ගන්නා තනතුරු) හා ඉංග්‍රීසි භාෂා හැකියාව පිළිබඳව පමණක් සටහන් කිරීමට අවස්ථාව තිබුණි. නිලධාරීන් විසින් සිදු කර ඇති අධිකරණ කටයුතු පිළිබඳව හෝ වැටලීම් රාජකාරි පිළිබඳව සටහන් කිරීමට අයදුම් පත්‍රයේ පැහැදිලි ස්ථානයක් නොතිබුණි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහත තනතුර නියෝජනය කරන නිලධාරීන් , වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ක්‍රියාත්මක කරන සාම නිලධාරීන් වන නිසා වනජීවී නීතිය පිළිබඳව දැනුම හා පුහුණුව රාජකාරි සිදු කිරීම සඳහා අවශ්‍යම අංගයකි. ඒ සෑම නිලධාරියෙකුටම පොදුවේ ලබාදිය යුතුය. නමුත් මෙම පුහුණුව නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන මූලික පුහුණුවක් නොවන බව ඉල්ලුම්පත්‍රය යොමු කිරීමේ ක්‍රමවේදය මගින් මනාව පැහැදිලි කරනු ලබයි.

මෙම ලිපියට අදාල ලිපි ගොණුව Special Training ලෙස සඳහන් වන නිසා මෙය විශේෂ පුහුණුවක් බව පැහැදිය. නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබාදිය යුත්තේ, දෙපාර්තමේන්තුව මගින් නිලධාරීන්ට ලබා දෙන මූලික නීතිය ක්‍රියාත්මක කිරීමේ පාඨමාලාව හදාරා ඇති සහ සක්‍රියව වනජීවී දෙපාර්තමේන්තුවේ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු වලට දායක වන නිලධාරීන්ටය, අධිකරණ වල නඩු මෙහෙය වන දක්ෂතා ඇති නිලධාරීන්ටය.

පසුව කාර්යාලවලට එවා තිබූ සහකාර අධ්‍යක්ෂ (නීතිය ක්‍රියාත්මක කිරීම) ඩී.එම්.වීරසිංහ මහතා විසින් අත්සන් තබා ඇති අංක වජී/05/16/ Special Training 01/2021 හා 2021.11.10 දිනැති ලිපිය මඟින් දන්වා තිබූ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් තරඟ විභාගයට භාජනය කරනු ලබන බවත්, තරඟ විභාගය සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන බවත්ය. ඒ අනුව මූලික අයදුම්පත්‍රය එවූ දිනයේ සිට ආසන්නතම මාස 04 ක් පමණ ගොස් අයදුම්කරුවන්ට වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත ආශ්‍රයෙන් සකස් කරන ලද බහුවරණ ප්‍රශ්ණ 50 ක තරඟ විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන බව දැනුම් දෙනු ලබයි. තවද එමඟින් අවසන් පුහුණුලාභීන් තෝරා ගන්නා බවද පවසා ඇත. මෙම දැනුම් දීම මුල් අවස්ථාවේදීම සිදු කල යුතුය. තවද ඉහතින් සදහන් කරන ලද නිලධාරීන්ගේ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව ඉංග්‍රීසි භාෂාව අනිවාර්යයෙන් සමත් විය යුතු විෂයක් නොවන නිසා මෙම තරඟ විභාගය ඉංග්‍රීසි මධ්‍යයෙන් පැවැත්වීම නිලධාරීන්ගේ මූලික අයිතිවාසිකම් පවා කඩ වීමකි.

එම ලිපියට පසුව කාර්යාල වලට එවා තිබූ අධ්‍යක්ෂ (මෙහෙයුම්) ගේ අංක:WL/05/16/ Special Training 01/2021 හා 2022.01.06 දිනැති ලිපිය මඟින් දන්වා තිබුනේ වනජීවී කලාප වලින් යොමු කල අයදුම්පත් ඇගයීමට ලක් කිරීමේදී බහුතරයක් සම්පූර්ණ අයදුම්පත් බව නිරීක්ෂණය වූ බවත් , ආසන්න අධීක්ෂන නිලධාරියා සහ කලාප සහකාර අධ්‍යක්ෂ වරුන් විසින් අයදුම්පත් යොමු කිරීමේදී දක්වා ඇති නොසැලකිලිමත් බව අයදුම්පත් ප්‍රතික්ෂේප වීම කෙරෙහි මූලිකව බලපා ඇති බවත්ය. පොලොන්නරුව , බස්නාහිර , දකුණ , අනුරාධපුර වැනි කලාප වල සියලු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප වී ඇති අතර , අනෙකුත් කලාප වලද බොහෝ නිලධාරීන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප වී ඇත. අයදුම්පත් යොමු කිරීමේදී ආසන්නතම අධීක්ෂණ නිලධාරීන් සහ කලාප භාර සහකාර අධ්‍යක්ෂ වරුන් නොසැලකිලිමත් බවක් දක්වා ඇත්නම් ඒ සම්බන්ධව ඔවුන්ට විරුද්ධව කටයුතු කරනවා වෙනුවට අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුවක් හා සමානය. තවද එම ලිපියේ සදහන් වූයේ ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව විස්තර පසුව දැනුම්දෙනු ලබන බවයි. නමුත් මේ වන තෙක් එවැනි දැනුම්දීමක් සිදුකර නොමැත. තවද එම ලිපියෙන් පැහැදිලි වනුයේ එකම ප්‍රශ්ණ පත්‍රය වේලාවල් 02 කදී කණ්ඩායම් දෙකකට දී ඇති බවයි.එයද ප්‍රශ්ණගත ක්‍රියාවකි. මෙවැනි කරුණු හමුවේ පැහැදිලි වන්නේ මෙම විභාගය නිසිදු විනිවිද භාවයකින් තොරව පවත්වා ඇති බවයි.

එම ලිපියට පසුව කාර්යාල වලට එවා තිබූ සහකාර අධ්‍යක්ෂ (නීතිය ක්‍රියාත්මක කිරීම) ඩී.එම්.වීරසිංහ මහතා විසින් අත්සන් තබා ඇති අංක වජී/05/16/ Special Training 01/2021 හා 2022.03.16 දිනැති ලිපිය මඟින් දන්වා තිබුනේ විභාගය සමත් අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණය 2022.04.01 දින පැවැත්වෙන බවත් , එය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන බවත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් 2022.01.21 දින රන්දෙණිගල වනජීවී පුහුණු කේන්ද්‍රයේදී පැවැත්වූ බවත්ය. පැහැදිලිව කියනවානම් අදාල තරඟ විභාගය පැවැත්වූයේ සුදුසුකම් අයදුම්කරුවන්ට නොව නොසැලකිලිමත් භාවයකින් තොරව නිර්දේශ ලබා දී තිබූ ආසන්න අධීක්ෂණ නිලධාරීන් සහ කලාප භාර සහකාර අධ්‍යක්ෂක වරුන් විසින් යොමුකල අයදුම්පත් වල සිටින නිලධාරීන්ටය.

තාක්ෂණය ඉතා අවමව භාවිතා කරනු ලබන දෙපාර්තමේන්තුවක් වන, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ ආකාරයේ වැඩසටහනක් සංවිධානය කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන අතර , තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව ඉතා පිළිකුලෙන් යුතුව අපගේ විරුද්ධත්වය ප්‍රකාශ කරමි. මන්ද යත් මෙම තරඟ විභාගය සඳහා තේරීපත්වී තිබූ බොහෝ නිලධාරීන් දෙපාර්තමේන්තුවේ නීතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු වලට සක්‍රියව දායක නොවන නිලධාරීන් ලෙස සඳහන් කල හැකිය. නීතිය සක්‍රියව ක්‍රියාත්මක කිරීමට උරදෙන මෙම තරඟ විභාගය සඳහා ඉල්ලුම් කර තිබූ ඉල්ලුම්කර තිබූ බොහෝ නිලධාරීන් පිරිසකට තරඟ විභාගය සඳහා මුහුණ දීමේ අවස්ථාව අහිමි කර තිබුණි. තවද බොහෝ නිලධාරීන් පිරිසකට අදාල අයදුම්පත්‍රයවත් ලැබී නොතිබූ නිසා අයදුම් කිරීමට නොහැකි විය.

වනජීවී දෙපාර්තමේන්තුවේ සෑම කාර්යාලයකින් පාහේ අලුතෙන් පවරන නඩු , විභාග වන නඩු සහ අවසන් වූ නඩු වල විස්තර , සාක්ෂි කරුවන් සහ නඩු මෙහෙයවනු ලබන නිලධාරීන්ගේ නම්ද සමග කලාප කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලය වෙත යවනු ලබයි. එම නිසා පැහැදිලිව නීති අංශයට වනජීවී දෙපාර්තමේන්තුවේ නීතිය ක්‍රියාත්මක කිරීමේදි සක්‍රියව ඒ සඳහා දායක වන නිලධාරීන් කලාප මට්ටමින් හඳුනා ගැනීමේ හැකියාව තිබිය යුතුය. වාර්තා කොපමන යැවූවත් නීති අංශය ඒවායින් ප්‍රයෝජනයක් නොගන්නා බව මෙවැනි තෝරාගැනීම් වලින් මනාව පැහැදිලි වනු ලබයි. මේ ආකාරයට සිදු කරනු ලබන තෝරාගැනීම් මඟින් සිදු වනු ලබන්නේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මහත් වෙහෙසක් ගන්නා නිලධාරීන් අධෛර්යමත් භාවයට හා කලකිරීමට පත්වීම පමණි. එය වනජීවී ක්ෂේත්‍රය තුළ සුලභව දක්නට ලැබෙන තත්වයක් බවට පත්ව ඇත. වනජීවී දෙපාර්තමේන්තුවේ පවතින පරිපාලන දුර්වලතාවයන් ඔප්පු කිරීම සඳහා මෙම සිදුවීම තවත් එක් උදාහරණයක් පමණි. මෙහි ඇති තවත් හාස්‍යයට පත්වන කරුණක්නම් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත් වූ තරඟ විභාගය හා ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණය සඳහා වන සියලු උපදෙස් සිංහල භාෂාවෙන් ලබා දී තිබීම සහ ඊට අදාල මෙම ලිපිය මඟින් සඳහන් කර ඇති සියලුම ලිපිද සිංහල භාෂාවෙන් ලබාදී තිබීමයි.

2022.04.01 දින ප්‍රධාන කාර්ලයේදි පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී ඇති නිලධාරීන් කණ්ඩායම් 02 වෙන් කර එයින් පළමු වන කණ්ඩායම 2022.10.30 වන දින නේපාලය බලා පිටත්වන බව දැනට අපවෙත ලැබී ඇති තොරතුරු අනුව පැහැදිලිවනු ලබයි.

මේ ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මිනිසුන්ට ලැබී ඇති මූලික අයිතිවාසිකම් පවා උල්ලංඝනය කර තෝරාගෙන ඇති මෙම නිලධාරීන් පිරිස මෙම පුහුණුව සඳහා යැවීම නවත්වන ලෙසත් , නැවත අයදුම්පත් කැඳවා සාධාරණ තරඟ විභාගයක් පවත්වා සුදුසු අයදුම්කරුවන් තෝරා ගන්නා ලෙසත් , මින් ඉදිරියට මෙවැනි තරඟ විභාග පැවැත්වීමේදී විනිවිද භාවයෙන් යුතුව සාධාරණව පැවැත්වීම සඳහා SLIDA වැනි වෙනත් ආයතනයක් යටතේ අපක්ෂපාති සාධාරණ විභාගයක් පවත්වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. කඩිනමින් එසේ නොකල හොත් මේ පිළිබඳව අවධානය යොමු කර වනජීවී නිලධාරීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට අකමැත්තෙන් වුවද සිදු වන බවත් වැඩිදුරටත් ඉතා කාරුණිකව දන්වා සිටිමි. අපගේ සහෝදර වෘත්තීය සමිති විසින් මෙම කරුණ පිළිබඳව ගරු වනජීවී අමාත්‍ය වරයා , අමාත්‍යාංශ ලේකම් , වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වනජීවී අධ්‍යක්ෂ (මෙහෙයුම්) මේ වන විටත් දැනුවත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැති බවත් අකමැත්තෙන් වුවද සඳහන් කරමි.

සභාපති

ලේකම්

ගරු ලේකම්
එච්.එම්.ජී.වීරසේන
වනජීවී අඩවි සහකාර
වෘත්තිකයන්ගේ සංගමය
[illegible] ජාතික වන උද්‍යානය - [illegible]

භාණ්ඩාගාරික

පිටපත්: 01. [illegible]
02. වනජීවී හා වනසම්පත් අමාත්‍යාංශ ලේකම්තුමිය.
03. [illegible]
04. ගොනුවට.